2020. 04. 23. අප පරිහරණය කරන දේ

මෙම තේමාව යටතේ අද අපි පාසලේ විවිධ ස්ථාන ආශ්‍රිතව ඇති සුවිශේෂී උපකරණ හඳුනා ගනිමු. ඒ ඇසුරින් පහත වගුව පුරවමු.

| ක්‍රීඩා පිටිය | සංගීත කාමරය | කාර්යාලය | කෘෂිකර්ම ඒකකය | පන්ති කාමරය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

ඉහත සඳහන් කළ උපකරණ තබා ඇති පිළිවෙළ හා ඒවායින් ලබාගන්නා ප්‍රයෝජන වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

පාසල හා පන්ති කාමරය තුළ පවත්නා ඉහත කී උපකරණ අප සතු සම්පත් මෙන්ම අපගේ පොදු දේපලකි. ඒවා අනාගත පරපුරටද උරුම කර දීමට අප ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතුය.



***ඉහත කී සම්පත් පාසල තුළ තිබෙන බවට කාර්යාලය මගින් Inventory නමින් පොතක ලියන බව ඔබ දන්නවාද?***

ඉහත පොදු දේපල භාවිතයේදී අප සැලකිලිමත් විය යුතු කරුණු

- පිරිසිදුව  තබා ගැනීම
- පිළිවෙළ ට තබා ගැනීම
- කැඩී බිඳී යාමක් සිදු වුවහොත් වරද පිළිගෙන එය නැවත සැකසීම
- භාවිතයෙන් පසු නිසිතැන තැබීම

උපකරණ භාවිතයේදී මෙන්ම ක්‍රීඩා කිරීමේදී ආරක්ෂිතව කටයුතු කළ යුතු අතර එසේ නොවීමෙන් අනතුරු සිදුවිය හැකි බැවින් ආරක්ෂාකාරීව කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

**<u>උපකරණ භාවිතයේදී විය හැකි අනතුරු</u>**

පිහියට අත කැපීම

ක්‍රීඩා පිටියේදී කවපෙත්ත ඇඟේ වැදීම

-----------------------------------------

-----------------------------------------

සැකසුම: සන්ධ්‍යා සමරසිංහ මිය 5-B

සන්ධ්‍යා සමරසිංහ